සාමාන්‍ය සමය සත්වන ඉරුදින **දේව ප්‍රකාශන** 19-02-12

## පළමුවන කියැවීම

ඉසයියස් 43:18-19,21-22,24-25

ඉසයියස් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයකි.

**"ඔබේ වරද සිහි නොකොට, ඔබේ පව් කමා කරන දෙවිඳුණෝ මම වෙමි."**

එහෙත්, සමිඳුණෝ මෙසේ වදාරන සේක. "පසුගිය දේ සිහි නොකරන්න. පෙර වූ දේ ගැන කල්පනා නොකරන්න. බලන්න, මම අළුත් දෙයක් කරන්නෙමි. එය දැනුදු ඉටු වේ. නුඹලාට එය නොපෙනේ ද? මම කාන්තාරයෙහි පවා මාර්ගයක් සාදා, එහි ජලධාරා ඇති වන්නට සලස්වන්නෙමි. ඔව්හු මා උදෙසා ම මා විසින් මවන ලද සෙනග ය. ඔවුන් මට ප්‍රශංසා කරනු ඇත." සමිඳුණෝ මෙසේ වදාරන සේක. "එහෙත්, ඉශ්රායෙල්වරුනි, ජාකොබ් වංශයෙනි, නුඹලා යාච්ඤා කළේ මට නොවේ. නුඹලා මා ගැන කලකිරුණහු ය. නුඹලා මා උදෙසා කට්ටකුමංජල් මිලේට ගත්තේ වත්, සත්ව පූජා තෙලෙන් මා තෘප්තිමත් කළේ වත් නැත. ඒ වෙනුවට නුඹලාගේ පව්වලින් නුඹලා මට බරක් වී, නුඹලාගේ අයුතුකම්වලින් මා වෙහෙසට පත් කළහු ය. එහෙත් නුඹලාගේ පව් සිහි නොකොට, නුඹලාගේ වරද කමා කරන දෙවිඳුණෝ මම ය. එසේ කරන්නේ, මම දෙවිඳුණන් වන නිසා ය."

දේව වාක්‍යය එසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 41:1-4,12-13

පිළිතුර: සමිඳුනී, මට කරුණා කළ මැනව.

ගීය: දිළින්දා සලකන්නා ආසිරි ලද්දේ ය. ඔහුගේ විපතින් සමිඳුණෝ ඔහු මුදන සේක.සමිඳුණෝ ඔහු රක්නා සේක. ඔහුට රැකවරණය දෙන සේක. මිහි මත ඔහුට ආසිරි දෙන සේක. සමිඳුණෝ සතුරන් අතට ඔහු පාවා නොදෙන සේක.

ලෙඩ ඇඳේ සිටින විට සමිඳුණෝ ඔහුට පිහිට වන සේක. රෝගාතුර ව සිටින විට සුවය දෙන සේක. "සමිඳුනී, මට කරුණා කළ මැනව. ඔබට විරුද්ධ ව පව් කළෙමි. මෙමා සුව කළ මැනව" යි පවසමි.

මා හරි දේ ඉටු කරන බැවින් ඔබ මට පිහිට වන සේක. සදහට ම ඔබ අබිමුව මා තබා ගන්න සේක. ඉශ්රායෙල් ජනතාවගේ දෙවි සමිඳුණන් හට ප්‍රශංසා වේවා! සදාකාලයෙන් සදාකාලයට ම ප්‍රශංසා වේවා! ආමෙන්, ආමෙන්.

## දෙවන කියැවීම

2කොරින්ති 1:18-22

ශුද්ධ වූ පාවුලු අපෝස්තුළු තුමන් විසින් කොරින්තවරුන්ට ලියන ලද දෙවන හසුනෙන් කොටසකි.

**ක්‍රිස්තුස් වහන්සේ තුළ "ඔව්", "නැහැ" කියා දෙගිඩියාවක් නැත. ඇත්තේ "ඔව්" යන්න පමණකි.**

සත්‍යවාදී දෙවියන් වහන්සේගේ නාමයෙන් දිවුරා මම ඔබට කියමි. ඔබට අපගේ වචනය "ඔව්", "නැහැ" කියා දෙගිඩියාවෙන් කියන්නක් නොවේ. මන්ද, අප විසින් එනම් සිල්වානස්, තිමෝතියස් හා මා විසින් ඔබ අතර දේශනා කළ දෙවියන් වහන්සේගේ පුත්‍ර වූ ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ "ඔව්", "නැහැ" කියා දෙගිඩියාවක් නැත. ඇත්තේ "ඔව්" යන්න පමණකි. දෙවියන් වහන්සේගේ සියලු ම පොරොන්දු ඉටු කිරීම පිළිබඳ

"ඔව්" යන්න ක්‍රිස්තුස් වහන්සේ වන සේක. දෙවියන් වහන්සේට ගරු බුහුමන් කරන පිණිස අප ක්‍රිස්තුස් වහන්සේ තුළින් "ආමෙන්" කියන්නේ ඒ නිසා ය. ක්‍රිස්තුස් වහන්සේ තුළ ඔබ සමග අප ශක්තිමත් කරන්නේ දෙවියන් වහන්සේ ය, උන් වහන්සේ අප ආලේප කර, උන් වහන්සේගේ මුද්‍රාව අප පිට තබා, අපගේ සිත් තුළ අපට අත්තිකාරමක් වශයෙන් ශුද්ධාත්මයාණන් වහන්සේ දෙවා වදාළ සේක.

දේව වාක්‍යය එසේ ය.

**සාධුකාරය** ලූක් 19:38

ආලේලූයා! ආලේලූයා!

සමිඳුන් නමින් වඩිනා රජුට ආසිරි වේවා!

ස්වර්ගයෙහි සාමය ද අති උසස් තැන්හි මහිමය ද වේවා!

ආලේලූයා!

**ශුද්ධවූ සුවිශේෂය** මාක් 1:40-45

සුවිශේෂක මාක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**මෙලොව දී පව් කමා කිරීමේ බලය මනුෂ්‍යය පුත්‍රයාණන්ට ඇත.**

දින ගණනකට පසු ජේසුස් වහන්සේ යළිත් කපර්ණවුමට පිවිසුණු සේක. උන්වහන්සේ ගෙදර සිටින බව පතළ විය. එවිට දොරකඩ අසලවත් ඉඩක් නැති තරමට මහ පිරිසක් එහි රැස් වූ හ. උන් වහන්සේ ඔවුන්ට දහම් දෙසමින් සිටි සේක. එකල සතර දෙනෙක් අංශබාග රෝගියෙකු උසුලාගෙන උන් වහන්සේ වෙත ආහ. සමූහය නිසා උන් වහන්සේ වෙත යාගත නොහැකි වූයෙන් ඔව්හු උන් වහන්සේ සිටි තැනට ඉහළින් පියස්සේ සෙවිල්ල හැර, පියස්ස කඩා, අංශබාග රෝගියා ඔත් යහන පහතට බැස්වූහ. ජේසුස් වහන්සේ ඔවුන්ගේ ශ්‍රද්ධාව දැක, "පුත්‍රය, ඔබේ පව් කමා කර තිබේ" යයි අංශබාග රෝගියාට වදාළ සේක. එහෙත් එතැන හුන් විනයධරයන්ගෙන් සමහරෙක් තර්ක කරමින්, "මේ මිනිහා මෙසේ කථා කරන්නේ මක්නිසාද? මේ දේව අපහාසයකි! දෙවියන් වහන්සේට මිස පව් කමා කරන්න පුළුවන් වෙන කාට දැ" යි සිතූ හ. ඔවුන් මෙසේ තර්ක කරන බව ජේසුස් වහන්සේගේ සිතට එකෙණෙහි ම දැනී, ඔවුන්ට කතා කොට, "ඔබ කුමක් නිසා ඔබේ සිත් තුළ මෙසේ තර්ක කරන්නහු ද? වඩා පහසු කුමක් ද? අංශබාග රෝගියාට 'ඔබේ පව් කමා කරන ලදැ'යි කීම ද? නැතහොත්, 'නැඟිට ඔබේ යහන රැගෙන යන්නැ' යි කීම ද? එහෙත්, මෙලොව දී පව් කමා කිරීමේ බලය මනුෂ්‍ය පුත්‍රයාණන්ට ඇති බැව් ඔබ දැන ගන්නා පිණිස මම මෙසේ කරමි"යි කියා උන් වහන්සේ අංශබාග රෝගියාට කතා කොට, "නැඟිට ඔබේ යහන රැගෙන ගෙදර යන්නැයි මම ඔබට කියමි"යි වදාළ සේක. ඔහු නැඟිට එකෙණෙහි ම යහන රැගෙන පිරිස බලා සිටිය දී ම නික්ම ගියේ ය. සියල්ලෝ ම විස්මිත ව, "මෙවැන්නක් අප කවදාවත් දැක නැතැ"යි කියමින් දෙවියන් වහන්සේට ප්‍රශංසා කළහ.

සුවිශේෂ වාක්‍යය එසේ ය.